R E S P E C T

WOMEN

# ජාතික සැලැස්ම මාර්ගෝපදේශය හා වැඩපොත

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සැපකර තිබේ

UN WOMEN

World Health Organization

# ජාතික සැලැස්ම මාර්ගෝපදේශය හා වැඩපොත:

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා කැපකර තිබේ

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සාක්ෂි මත පදනම් වූ එළඹුමක් ප්‍රකාශයට පත්කිරීම සඳහා ජාතික හා උප ජාතික ක්‍රියාවලිවලදී අවශ්‍ය ප්‍රායෝගික පියවර අමාත්‍යාංශ හවුල්කරුවන් ඇතුළු එක්සත් ජාතීන්ගේ කාර්යමණ්ඩලය ඇතුළු ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත ජාතික සැලැස්ම මාර්ගෝපදේශය හා වැඩපොත විසින් සපයනු ලැබේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ සම්ප්‍රදායික ප්‍රයත්නයන් විසින් බොහෝවිට අවධානය යොමුකරනු ලබන්නේ ව්‍යවස්ථාදායක සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ, බහු පාර්ශ්වීය සේවාවන් වෙත සම්බන්ධීකරණය කරන ලද ප්‍රවේශය සහ වැඩිදියුණු කරන ලද සම්පාදනයන් සහ වඩා යහපත් අන්දමින් දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය සහ භාවිතා කිරීම කෙරෙහිය. මේවා පරිපූර්ණ එළඹුමකදී අතිශය වැදගත් වේ. එහෙත්, ඒවා මුල් අවධියේදී ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අවශ්‍ය ඉලක්ක ආයෝජන නොවේ. පසුගිය දශකය පුරාම, අතිවිශාල සාක්ෂි සම්භාරයක් එක්රැස් කර ගෝලීය ව්‍යූහයන් තුළ ඉදිරිපත් කර තිබේ. වැළැක්වීම කළහැක්කක් බව සහ ඒ සඳහා ඔප්පු කරන ලද උපායමාර්ග තිබෙන බව එමගින් නිරූපණය කෙරේ.

මෙම මාර්ගෝපදේශය හා වැඩපොත පදනම් වන්නේ වැළැක්වීම සඳහා වන ගෝලීය ව්‍යූහය මතය. එයට එක්සත් ජාතීන්ගේ වැළැක්වීමේ රාමුව (2015) සහ එහි ඊළඟ අදියරයන් ද, RESPECT Women Framework (2019) ද අයත් වේ. එහි අරමුණ වන්නේ, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දුරලීමේ ඇපකැපවීම ඌනපූරණය කිරීම සඳහා වැළැක්වීම සඳහා නිශ්චිත වූ ජාතික සහ උප ජාතික සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා කැපවූ සැලැස්මක් සංවර්ධනය කිරීමට උපකාර කිරීමයි.[1] පරිපූර්ණ ජාතික සැලැස්ම වෙනුවට ආදේශ වීම එහි අරමුණ වන්නේ නැත. ඒ වෙනුවට එමගින් කරනු ලබන්නේ වැළැක්වීමේ සාධකය ජාතික සහ උප ජාතික සංදර්භයට ගැලපෙන පරිදි විස්තර කිරීම මගින් එය ඌනපූරණය කිරීමයි. මාර්ගෝපදේශය හා වැඩපොත යනු පුළුල් තාක්ෂණික සම්පත් හා මෙවලම් පැකේජයක කොටසකි. ඒවා සකස් කර තිබෙන්නේ RESPECT Women Framework ක්‍රියාත්මක කිරීම සඳහාය.


### 1 පියවර: වැළැක්වීමේ රාමුවලට හුරුපුරුදු වීම


**RESPECT Women: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම** විසින් සාක්ෂි මත පාදක වූ මූලෝපාය හඳුනාගැනීම සඳහා භාවිතයට පහසු රාමුවක් පිරිනමනු ලැබේ. එම මූලෝපාය විසින් ප්‍රචණ්ඩත්ව වැරදි කිරීමේ සහ වින්දිතභාවයට පත්වීමේ අවදානම් අවම කරනු ලැබේ. එසේම, වින්දිතභාවයට පත්වීමෙන් සහ වැරදි කිරීමෙන් ආරක්ෂා කරන්නන්ට තිබෙන අවදානම ද අවම කරනු ලැබේ. මෙම රාමුව පදනම් වන්නේ, ඇගයීම්වලින් සහ විධිමත් සමාලෝචනයන්ගෙන් උකහාගන්නා ලද ගෝලීය තොරතුරු සහ දැනුම එකතුව මතය. එම දැනුම එකතුව විවිධ රටවල සහ සංදර්භයන්ගේ මුලපිරුම් පරාසයක් ආවරණය කරයි. RESPECT Women Framework විසින් මනා පසුබිමක් සහ ජාතික මට්ටමේදී වැඩිදුර අධ්‍යයනය කළ යුතු අන්තර්ගතයන් සහ ගැටලු සපයනු ලැබේ. RESPECT රාමුවෙහි ඉදිරිපත් කර තිබෙන ඇතැම් සාධක විශ්වීය වේ. ඒවා ඔබගේ සංදර්භයන්ට ගැලපිය හැකිය. අනෙක් ඒවා සුවිශේෂ ජනවිකාස කණ්ඩායම් සහ සමාජ හා සංස්කෘතික සංදර්භයන් අනුව වෙනස් වේ. පිවිසුම් ස්ථානවල සහ සාක්ෂි පදනමෙහි සවිස්තර හැදෑරීමක් සඳහා ඔබට පහත දැක්වෙන ව්‍යූහය සමාලෝචනය කළ හැකිය: Framework to Underpin Action to Prevent Violence against Women (UN Prevention Framework).


**කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ ගෝලීය ව්‍යූහයන්**

UN Prevention Framework (2015) විසින් ප්‍රතිපත්ති සම්පාදකයන් සහ වැඩසටහන් සම්පාදකයන් හට මනා ලෙස සාක්ෂි මත පදනම් වූ මූලෝපායන් මූලාශ්‍රයක් සපයනු ලැබේ. එය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි වැඩසටහන් සැලසුම් කර, ක්‍රියාත්මක කර, අධීක්ෂණය කර ඇගයීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට උපකාර වේ.

RESPECT Women Framework (2019) සම්පාදනය කරනු ලබන්නේ ඉහත සඳහන් කරන ලද සාක්ෂි මත පදනම් වූ මූලෝපාය අනුවය. එය ප්‍රතිපත්ති සම්පාදකයන්ට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන් සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, අධීක්ෂණයට සහ ඇගයීමට උපකාර වේ.






## 2 පියවර: ක්‍රියාවලිය තුළ නිමග්න කරගනු ලබන ප්‍රධාන පාර්ශ්වකරුවන් තීරණය කිරීම

RESPECT Women Framework සමාලෝචනය කිරීමෙන් පසු, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩකරන ප්‍රධාන ආයතන හා ක්‍රියාකරුවන් හඳුනාගන්න. මීට පෙර පියවරවලදී ඉගෙනගත් දෙය මත පදනම්ව වැදගත් භූමිකාවක් ඉටුකිරීමේ වගකීම ඔවුන්ට තිබේ. ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර කාන්තා/ සමාජභාවී, සෞඛ්‍ය, අධ්‍යාපන, රැකියා, දිළිඳුභාවය හා තාරුණ්‍යය සමග සම්බන්ධ ආයතන මෙන්ම වෙනත් රාජ්‍ය ආයතනවල තාක්ෂණික කාර්යමණ්ඩලය, එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ක්‍රියාකරන සිවිල් සමාජය හෝ කාන්තා අයිතිවාසිකම් සංවිධාන නියෝජිතයන් ඇතුළත් විය හැකිය. එසේම, සම්ප්‍රදායික, සංස්කෘතික සහ ආගමික නායකයන් ද ප්‍රධාන පුද්ගල පාර්ශ්වකරුවන් අතර සිටිය හැකිය.

### කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ෆීජි ක්‍රියාකාරී සැලැස්ම

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සංවර්ධනය කරනු ලබන බව 2020දී ෆීජි රජය විසින් නිවේදනය කරන ලදී. ඒ අනුව එරට කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සමස්ත රජය විසින් ඇතුළත්කාරී, සාක්ෂි මත පදනම් වූ එළඹුමක් ලබාගත් (ඕස්ට්‍රේලියාව ද ඇතුළුව) ලොව රටවල් දෙක අතරින් එකක් බවට පත්විය. මෙම ක්‍රියාවලියට නායකත්වය ලබාදුන්නේ කාන්තා, ළමා සහ දිළිඳුකම දුරලීමේ අමාත්‍යාංශයයි. සෞඛ්‍ය හා වෛද්‍ය සේවා, අධ්‍යාපන, උරුමය සහ කලා සහ රැකියා, ඵලදායිතාව, කර්මාන්ත සම්බන්ධතා, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ආදිය එයට උපකාර කළහ. එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය, ෆීජි කාන්තා අර්බුද මධ්‍යස්ථානය, ෆීජි කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාරය, House of Sarah, Medical Services Pacific, Fiji Disabled People's Federation, Haus of Kameleon, DIVA සහ වෙනත් සංවිධාන වැදගත් පාර්ශ්වකරුවන් අතර වූහ.

බලන්න Joint Ministerial Press Release.

අදාළ පාර්ශ්වකරුවන් නිර්ණය කිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ දැනට සිටින ක්‍රියාකරුවන්ගේ විශ්ලේෂණයක් සිදුකරන්න. ඔවුන් දැනටත් වැළැක්වීම සඳහා ක්‍රියාකරමින් සිටිනවා විය හැකිය. නැතිනම්, එසේ කිරීමේ හැකියාව තිබෙන අය විය හැකිය. වැළැක්වීම සඳහා හඳුනාගෙන තිබෙන ක්‍රියාකරුවන් සහ ප්‍රවේශ ස්ථාන ලැයිස්තුවක් සඳහා බලන්න: RESPECT Strategy Summaries.

| මූලෝපාය | හවුල්කාරිත්වය | | |
|---|---|---|---|
| අපට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කුමන මූලෝපායද? | ඒ සඳහා අපට උපකාර කළ හැක්කේ කාටද? | | ඔවුන් දැනට කරමින් සිටින දෙය මූලෝපාය සමග සම්බන්ධ වන්නේ කෙසේද? |
| | අංශය | ක්‍රියාකරුවන් | |
| උදාහරණ:<br>ගෞරවනීය සම්බන්ධතා | අධ්‍යාපනය<br>තරුණ<br>ක්‍රීඩා | අධ්‍යාපන අමාත්‍යාංශය<br>තරුණ සමාජ<br>ජාතික ඔලිම්පික් කමිටුව | - අධ්‍යාපන අමාත්‍යාංශය පරිපූර්ණ ලිංගිකත්ව අධ්‍යාපනය සඳහා ඇපකැපවී සිටියි.<br>- තරුණ සමාජ සක්‍රිය ලෙස සමාජභාවී සමානාත්මතාව වෙනුවෙන් පෙනීසිටින අතර ඒ වෙනුවෙන් ක්‍රියාමාලාවල යෙදෙයි.<br>- පරම්පරා සමානාත්මතා මුලපිරුම සඳහා ක්‍රීඩා සමග ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ ජාතික කාර්යාලය එක්වී සිටියි. සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා එයට ප්‍රතිචාර දැක්වීමේ මුලපිරුම් එයට අයත් වේ. |
| | | | |
| | | | |
| | | | |

## 3 පියවර: ආයතනික දත්ත සමාලෝචනයක් මෙහෙයවන්න. රටෙහි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අවබෝධය ග්‍රහණය කරගැනීම සඳහා උපදෙස් විමසීමක් සිදුකරන්න

RESPECT Women Framework පදනම් වන්නේ, විවිධ රටවල සහ සංදර්භයන්ගේ මුලපිරුම් පරාසයක ඇගයීම් සහ විධිමත් සමාලෝචනයන් මගින් ලබාගන්නා ලද තොරතුරු සහ දැනුමෙහි ගෝලීය සම්පිණ්ඩනයකිනි. සිදුවන ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන්, පීඩාවට පත්වන ජනගහනයන්, වැරදි සිදුකිරීමේ හා වින්දිතකරණයේ අනුපාතිකය, පීඩාවට පත්වන විවිධ ජනගහනයන්ට අදාළ වන පරිදි වැරදි සිදුකිරීමට හා වින්දිතකරණයට බලපාන අවදානම් සාධක (ඉහත දක්වන ලද ආදර්ශය බලන්න) සහ එය සිදුවන්නේ ඇයිද යන්න පැහැදිලි කරන සෙසු සාධක ඇතුළු රටේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ තත්වය තක්සේරු කිරීම වැදගත්ය.

දැනට ලබාගත හැකි තොරතුරු විධිමත් දත්ත සමාලෝචනයකට ලක්කිරීම මගින් සහ වැදගත් කණ්ඩායම්වලින් උපදෙස් විමසීමෙන් මෙම තොරතුරු ලබාගත හැකිය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමීක්ෂණ ක්‍රමවේදය, Demographic and Health Surveys (DHS); International Men and Gender Equality Studies (IMAGES); UN Multi-Country Study on Men and Violence සහ සමාජභාවය සහ ප්‍රචණ්ඩත්වය පැවැත්ම, සංදර්භීය සාධක, ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් තක්සේරු කිරීම සඳහා ජාතික හෝ උප ජාතික වශයෙන් මෙහෙයවන ලද වෙනත් ඕනෑම සමීක්ෂණයක් වන ඕනෑම මහා පරිමාණ සමීක්ෂණයක සමාලෝචනයක් ආයතනික දත්ත සමාලෝචනයට ඇතුළත් විය යුතුය (අමතර මූලාශ්‍ර යෝජනා සඳහා ඇමුණුම බලන්න). වෙනත් වැදගත් තොරතුරු මූලාශ්‍ර අතරට පහත දැක්වෙන ඒවා අයත් වේ: ජාතික සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යාපනික ආයතන සහ එක්සත් ජාතීන් විසින් මෙහෙයවන ලද සමීක්ෂණ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ එය නිර්මාණය කර පවත්වාගෙන යන සාධක හඳුනාගැනීම සඳහා ප්‍රමාණාත්මක සහ/හෝ ගුණාත්මක අධ්‍යයන හඳුනාගැනීම සඳහා ගූගල් හෝ වෙනත් අදාළ විද්‍යුත් දත්ත පදනමක් (PubMed, Science Direct වැනි) භාවිතා කළ හැකිය.

දැනට තිබෙන සාක්ෂි පදනම සීමිත වන සංදර්භයන්හිදී, ජාතික සැලැස්ම හා ප්‍රතිපත්තිවල අඩුපාඩු සපිරීම සඳහා වැඩිදුරටත් සමීක්ෂණ සිදුකිරීම පිණිස අරමුදල් සම්පාදනය සලකාබැලීමට ප්‍රතිපත්ති සම්පාදකයන් කැමැත්තක් දැක්විය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සියලු සමීක්ෂණ ආචාරධාර්මික ප්‍රමිතිවලට අනුකූල විය යුතු අතර කාන්තාවන්ගේ ආරක්ෂාව සහතික කළ යුතුය. එවැනි සමීක්ෂණවලට අනුග්‍රහය දැක්වීමේදී ඇසිය යුතු වැදගත් ප්‍රශ්න මෙවැනි ඒවායට

- රට තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ රටාවන් (වර්ග, මට්ටම්, බේරුණු පුද්ගලයන්, වැරදි කරන්නන්) වෙනස් වන්නේ කෙසේද?
- ප්‍රචණ්ඩත්වය සිදුවන්නේ කොහේද? එනම්, පෞද්ගලික (නිවාස වැනි) තැන්වල ද, නැතිනම් පොදු ස්ථානවලද (උදා: වීදිය, වෙළඳපොළ, පුස්තකාල, විවේක ස්ථාන, පොදු ප්‍රවාහනය, සේවා ස්ථාන, සමාජ හෝ දේශපාලන අවස්ථා සහ පාසල් ආදී)?
- ප්‍රචණ්ඩත්වයේ අවදානමට වැඩිපුර ලක්විය හැක්කේ කුමන කාන්තා කණ්ඩායම්ද? (උදා: වයස, ජනවර්ගය, ජාතිය, විවාහක තත්වය, එච්අයිවී තත්වය, ආගම, ආබාධිත තත්වය, සමාජ ආර්ථික තත්වය, සංක්‍රමණික තත්වය, ලිංගිකභාවය සහ සමාජභාවී අනන්‍යතාව)
- කාන්තාවන් ප්‍රචණ්ඩත්වය අත්විඳීමේ වැඩි අවදානමට ලක්කරන්නේ කුමන සාධක විසින්ද?
- පිරිමින් ප්‍රචණ්ඩත්වය අත්විඳීමේ වැඩි අවදානමට ලක්කරන්නේ කුමන සාධක විසින්ද?
- පිරිමින් ප්‍රචණ්ඩත්වය සිදුකිරීමේ සහ කාන්තාවන් ප්‍රචණ්ඩත්වය විඳීමේ අවදානම අවම කරනු ලබන්නේ කුමන සාධක විසින්ද? (එනම්, ආරක්ෂක සාධක)
- ප්‍රචණ්ඩත්වය පවත්වාගෙන යන නිශ්චිත සමාජ සම්මතයන්2 සහ ආකල්ප මොනවාද? ඒවා ප්‍රවර්ධනය කරන්නේ කවුරුන්ද?

මෙම ප්‍රශ්නවලට පිළිතුරු මගින් ද උපදෙස් විමසීම්වල අඩංගු කරගත යුතු පාර්ශ්වකරුවන් සහ වැළැක්වීමේ මුලපිරුම් ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ පිළිතුරු ලබාගත හැකිය.

වැඩමුළු ස්වරූපයේ වැඩසටහනක් වෙනුවෙන් සාක්ෂි සහ අත්දැකීම් මගින් දායක විය හැකි පාර්ශ්වකරුවන් ඒකරාශී කළහැකි පුහුණු පහසුකම් සපයන්නකු හඳුනාගන්න. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පොදු අර්ථකථන සහ සංකල්පගත කිරීම් ඉලක්ක කරන්න. එය විස්තර කරන භාෂාවට එකඟ වන්න. වැදගත් පාර්ශ්වකරුවන් විසින් රටේ සංදර්භය තුළ එය වලංගු කළ යුතුය. මෙම තත්වය සාක්ෂාත් කරගැනීම සඳහා කාලසීමාව තුළ රැස්වීම් කීපයක් අවශ්‍යය. එසේම, සහභාගි වීමට බැරි වූ කණ්ඩායම් තුළ තොරතුරු වලංගු කරගැනීම ද අවශ්‍ය විය හැක (උදා: ආබාධිතභාවය ගැන).

එකිනෙක හරහා යන අනන්‍යතා සහිත සහ සත්‍ය අත්දැකීම් මගින් මූලෝපායට දායක විය හැකි කණ්ඩායම්වල අරුත්බර නියෝජනයක් උපදෙස් විමසීම් තුළ අඩංගු විය යුතුය. උපදෙස් විමසීම් පැවැත්විය යුත්තේ දෘඪ බහුපාර්ශ්වීය සන්ධාන හා ස්ථාපිත සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මගින් තිරසර කිරීමේ හැකියාව තිබෙන ජාලයන් ගොඩනැගීමේ අරමුණෙනි.

## තොරතුරු ලේඛනගත කිරීම සඳහා පහත දැක්වෙන කාර්ය පත්‍රිකාව භාවිතා කරන්න

අවදානම හා ආරක්ෂක සාධක තක්සේරු කිරීමේදී සුවිශේෂ කොන්කරන ලද කාන්තා කණ්ඩායම්වලට විශේෂ අවධානය යොමුකළ යුතුය. ඔවුන් ලිංගික හා සමාජභාවී අසමානතා නිසා සහ වයස, ජාතිය, ලිංගිකභාවය සහ සමාජභාවී අනන්‍යතාව, ආදායම, පුරවැසි තත්වය, ආබාධිතබව සහ/ හෝ වෙනත් සාධක සමග සම්බන්ධවන වෙනත් අසමානකම් හේතුවෙන් වෙනස්කම්වලට ලක්වීමේ අත්දැකීම් නිසා ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ වැඩි අවදානමකට ලක්විය හැකිය. ජනගහනය තුළ විවිධ කාන්තාවන් (වැරදිකරුවන්) හට අදාළ වන අවදානම් සහ ආරක්ෂක සාධක අවශ්‍ය පරිදි හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන වගුව ආකාරයේ එකක් යොදාගත හැකිය.

| අවදානම් සාධක | ජනගහන කණ්ඩායම හඳුනාගන්න:<br>**සියලු කාන්තාවන්**<br>**සංක්‍රමණික කාන්තාවන්**<br>**ආබාධ සහිත කාන්තාවන්**<br>**ජනවාර්ගික හෝ ජාති සුළුතරයන්ට අයත් කාන්තාවන්** | ආරක්ෂක සාධක |
|---|---|---|
| **ඔබෙන්ම අසන්න:** වැරදි කිරීමට හා වින්දිතකරණයට දායක වන්නේ කුමන සාධක සහ කොන්දේසිද? | | **ඔබෙන්ම අසන්න:** වැරදි කිරීමේ හෝ වින්දිතකරණයේ හැකියාව අවම කිරීම සඳහා දායක වන්නේ කුමන තත්වයන්ද? |
| | පුද්ගල | |
| | අන්තර් පුද්ගල | |
| | ප්‍රජාව | |
| | සමාජීය | |

පහත දැක්වෙන රූපසටහන විසින් නිරූපණය කරනු ලබන්නේ, පුද්ගල, සම්බන්ධතා, ප්‍රජා සහ ආයතනික මට්ටම්වලදී පරිසර විද්‍යාත්මක ආදර්ශයට අනුකූලව පවත්වන ලද ගෝලීය සමීක්ෂණ මගින් තහවුරු කරන ලද බහුවිධ අවදානම් සහ ආරක්ෂණ සාධකයි. ජාතික මට්ටමේදී ලේඛනගත කරන ලද සොයාගැනීම් වැඩිදුරටත් වලංගු කිරීම සඳහා එය භාවිතා කළ හැකිය.

## පරිසර විද්‍යාත්මක ආදර්ශය අවබෝධ කරගැනීම


### සමාජ පාරිසරික ආදර්ශය

**සමාජයීය**
- කාන්තාවන් හට ආර්ථික අයිතිවාසිකම් අවම වීම
- වෙනස්කොට සලකන පවුල් නීති
- සාමූහිකවාදී සංස්කෘතික නැමියාව
- වැටුප් ගෙවන රැකියාවන්වලට කාන්තාවන්ට ප්‍රවේශය අවම වීම

**අන්තර් පුද්ගල**
- අසමාන තීරණ ගැනීම
- දුර්වල සන්නිවේදන කුසලතා
- ඉහළ මට්ටමේ සම්බන්ධතා ගැටුම්

**කාන්තාවන් (කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අත්දැකීම)**
- තරුණ
- ළමාවියේදී ප්‍රචණ්ඩත්වයේ අත්දකින
- ළමාවියේ ප්‍රචණ්ඩත්වය දකින
- ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිගන්නා ආකල්ප
- පහළ මට්ටමේ සමාජ සහාය

**කාන්තාව - විවිධ සංදර්භයන් තුළ අවදානම් හෝ ආරක්ෂණ සාධක**
- කාන්තාවන්ගේ රැකියා/ ආදායම් උත්පාදනය
- වත්කම් හිමිකාරිත්වය
- ණය වෙත ප්‍රවේශය



### අවදානම් සාධක

**ප්‍රජාව**
- කාන්තාව මත පුරුෂාධිපත්‍යය ඉවසන සමාජ සම්මතයන්
- පිරිමින්ගේ ගෞරවය කාන්තාවන්ගේ ගරුත්වය සමග සම්බන්ධ කරන සමාජ සම්මතයන්
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ තත්වය පාලනය කරන සමාජ සම්මතයන්
- දික්කසාද/ තනි කාන්තාවන් සම්බන්ධයෙන් පවතින අපකීර්තිමත් ආකල්ප
- පවුල් රහස් සම්බන්ධ සමාජ සම්මතයන්
- ප්‍රාදේශීය දරිද්‍රතාව
- විරැකියාව
- පුළුල් අසල්වැසි පරිසරයේ ප්‍රචණ්ඩත්වය
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව සමාජ හෝ නීතිමය සම්බාධක නොමැති වීම

**පිරිමි (කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව වැරදි සිදුකිරීම)**
- තරුණ
- පහළ අධ්‍යාපනික මට්ටම
- ළමාවියේදී ප්‍රචණ්ඩත්වය අත්දැකීම/ දැකීම
- සමාජභාවී වශයෙන් සමානාත්මතාවාදී නොවන ආකල්ප
- ප්‍රචණ්ඩත්වය භාරගන්නා ආකල්ප
- මානසික අක්‍රමවත්භාවය
- මත්පැන්/ මත්ද්‍රව්‍ය භාවිතය

**කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මූලික හේතු**

ගැහැණු ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහි සමාජභාවී අසමානතා සහ වෙනස්කොට සැලකීම් හැඩගැසෙන්නේ ආර්ථික, දේශපාලන හා සමාජ සාධක, ප්‍රතිපත්ති හා නීතිමය ව්‍යුහයන් ඇතුළු පද්ධති හා සමාජ සම්මතයන්, ඓතිහාසික සාධක (උදා: ගැඹුරට පැතුරුණු සංස්කෘතික භාවිතාවන්, යුද්ධය, යටත්විජිතකරණය), වයස, ආදායම, ජාතිය, ජනවර්ගය, ආබාධිතභාවය, සමාජභාවී අනන්‍යතාව, ලිංගික නැඹුරුව හා වෙනත් ලක්ෂණ මත පදනම් වූ ව්‍යුහාත්මක විශේෂතා අනුවයි.

## 4 පියවර: ජාතික සංදර්භයට එරෙහි මැදිහත්වීම පිළිබඳ ජාත්‍යන්තර සාක්ෂි තක්සේරු කරන්න

ඔබගේ ජාතික හෝ උප ජාතික කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සැලැස්ම පදනම් විය යුත්තේ ජාත්‍යන්තරව ස්ථාපිත කරන ලද සාක්ෂි මතය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ විශ්වසනීය භාවිතාවන් ලබාදිය යුතුය[3]. පසුගිය දශකය තුළදී, ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල ගෝලීය සාක්ෂි පදනමෙහි[4] කැපීපෙනෙන වර්ධනයක් සිදුවිය. එමගින් එක්සත් ජාතීන්ගේ වැළැක්වීමේ සහ RESPECT ව්‍යුහයන්ගේ සංවර්ධනයට මෙන්ම එළඹුම් හැඩගස්වාගැනීමේ සහ වර්ධනය කරගැනීමේ මෙවලම් සහ සම්පත්වලට තොරතුරු ලැබිණි.

RESPECT ව්‍යුහය මගින් මූලෝපායේ කුලුනු හත වටා සංවිධානය කරන ලද සාක්ෂි පදනම පිළිබඳ වර්තමාන සාරාංශයක් සපයනු ලැබේ. එය පහත දැක්වෙන රූපසටහනෙහි සරල ලෙස ඉදිරිපත් කර තිබේ.

- **R** සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම
- **E** කාන්තාවන් සවිබලගැන්වීම
- **S** සේවාවන් සහතික කිරීම
- **P** දිළිඳුකම අවම කිරීම
- **E** ආරක්ෂිත පරිසරයක් සැපයීම
- **C** ළමා හා නව යොවුන් අපයෝජන වැළැක්වීම
- **T** ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම

## 5 පියවර: වැළැක්වීමේ සැලැස්මක් සංවර්ධනය කිරීම

සාක්ෂි පදනමින් සහ උපදෙස් විමසීම්වලින් තොරතුරු ලබාගෙන, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන ස්වරූප, මූලෝපායන්, පසුබිම් හා ජනගහනයන් හඳුනාගන්නා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් මූලෝපායක් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් හට හැකිය. ජාතික හා උප ජාතික වැළැක්වීමේ මූලෝපායන් දුර විහිදෙන, විවිධ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ස්වරූප සියල්ල ඇතුළත් කරගන්නා සහ සමස්ත ජනගහනයම ඉලක්ක කළ, කිසිවකු බැහැර නොකරන මූලධර්මයට බැඳුණු ඒවා විය යුතුය.

සාක්ෂිවලින් පැහැදිලි වන ආකාරය අනුව, කාර්යක්ෂම සහ තිරසර වීම සඳහා, ප්‍රාථමික වැළැක්වීමේ මූලෝපායන් තුළට බහුවිධ මාර්ග ඔස්සේ පුද්ගල ආකල්ප සහ ප්‍රචණ්ඩත්වයට උපකාර කරන ඉවසන හෝ එයට සමාව දෙන සංවිධානමය, සමාජ හා සංස්කෘතික භාවිතාවන් සම්බන්ධ කරගෙන වැඩකිරීම ඇතුළත් විය යුතුය. සමාජභාවී අන්දමින් වෙනස්කම් කරන සහ සංස්කෘතිය, ආකල්ප සහ චර්යාවන් ඒකාකෘතිගත කරන භාවිතාවන් ඒ අතර වේ. මූලෝපායන් නීත්‍යානුකූල විය යුතු අතර නීතිමය ව්‍යුහය විසින් ඉලක්ක විවිධ ජන කණ්ඩායම් ශක්තිමත් කිරීම ඉලක්ක කළ යුතුය. එම ජන කණ්ඩායම් ජීවත්වන, වැඩකරන හා සමාජානුයෝජනය වන විවිධ පරිසරයන් ද එහිදී අදාළ වේ. එසේම, පසුබිම් පරාසයක් (පාසල්, සේවාස්ථාන සහ මාධ්‍ය වැනි) තුළ වැඩකිරීම සහ විවිධ ජන කණ්ඩායම් (පිරිමින් හා පිරිමි ළමයින්, මව්පියන්, ළමයින් වැනි) ද අදාළ වේ. එසේ වැඩ කරන්නේ, පරිසර විද්‍යාත්මක ව්‍යුහයේ පුද්ගල, සංවිධානමය, ප්‍රජා සහ සමාජ මට්ටම්වලය.

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා රාජ්‍යයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සැලැස්ම (2010 -2020) යනු, ප්‍රාථමික වැළැක්වීම උදෙසා වන දිගුකාලීන හා බහු පාර්ශ්වීය ව්‍යුහයකි. එය සමස්ත රාජ්‍ය එළඹුම හරහාම විහිදේ. එම සැලැස්ම සඳහා තොරතුරු ලබාගත්තේ සාක්ෂි සමාලෝචනයකිනි. එය ලබාගත්තේ සෞඛ්‍ය ප්‍රවර්ධනයේ සෞඛ්‍ය ප්‍රවර්ධනයේ හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සමාජ පරිසර විද්‍යාත්මක ආදර්ශයෙනි. එම සැලැස්ම විසින් ක්‍රියාකාරීත්වය සඳහා යෝජිත පරිසරය හා ජන කණ්ඩායම් හඳුනාගනියි. එසේම, සමාජ, ප්‍රජා/ සංවිධානමය සහ පුද්ගල/ සම්බන්ධතා මට්ටම් වැරගන්වන්නා වූ ප්‍රතිපත්ති එයට ඇතුළත් වේ.

# කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මූලික මට්ටමේදී වැළැක්වීමේ මාර්ගෝපදේශ රාමුව

## ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන නිර්ණය සාධක සහ ක්‍රියාකාරීත්වය සඳහා තේමාව

### පිරිමින් සහ ගැහැණුන් අතර සමාන හා ගෞරවනීය සම්බන්ධකම් ප්‍රවර්ධනය කිරීම

#### පුද්ගල/ සම්බන්ධතා නිර්ණය සාධක

- දෘඪ සමාජභාවී භූමිකා සහ අනන්‍යතා, සමාජභාවී සමානාත්මතාව සඳහා දුබල සහාය
- බැඳීමෙහි පුරුෂ නැමියාව/ හැඟීම
- සම්බන්ධතාවෙහි ධනය පාලනය කිරීමේලා පුරුෂ ආධිපත්‍යය

#### ප්‍රජා සහ සංවිධානමය නිර්ණය සාධක

- සමාජභාවය හා ලිංගිකත්වය සම්බන්ධ සංස්කෘතික වශයෙන් නිශ්චිත සමාජ සම්මතයන්
- පුරුෂ සම කණ්ඩායම් හා සංවිධානමය සංස්කෘතිය

#### සමාජමය නිර්ණය සාධක

- ආයතනික හා සංස්කෘතික සහාය හෝ සමාජභාවය වෙනුවෙන් දුබල සම්බාධක සහ දැඩි සමාජභාවී භූමිකා

## දායක වන වැදගත් සාධක හා ක්‍රියාකාරීත්වය සඳහා තේමා

### ප්‍රචණ්ඩ නොවන සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීම/ කලින් ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ බලපෑම් අවම කිරීම

#### පුද්ගල/ සම්බන්ධතා දායකත්ව සාධක

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා ආකල්පමය සහාය
- ළමයකු ලෙස පවුලේ ප්‍රචණ්ඩත්වය දැකීම හෝ අත්දැකීම් ලැබීම
- වෙනත් ආකාරවල සාමූහික ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම
- අන්තර් පුද්ගල ගැටුම් විසඳීමේ ක්‍රමයක් ලෙස ප්‍රචණ්ඩත්වය පිළිගැනීම

#### ප්‍රජා සහ සංවිධානමය දායකත්ව සාධක

- ප්‍රචණ්ඩත්වයට සහයෝගී හෝ අඩුවෙන් සම්බාධක පණවන අසල්වැසි, සම කණ්ඩායම් සහ සංවිධානමය සංස්කෘතිය
- ප්‍රජා හෝ සම කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය

#### සමාජමය දායකත්ව සාධක

- ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයඅනුමත කිරීම හෝ දුබල සම්බාධක පැණවීම
- අන්තර් පුද්ගල, පුරවැසි හෝ දේශපාලන ආරාවුල් විසඳීමේ ක්‍රමයක් ලෙස ප්‍රචණ්ඩත්වය භාරගන්නා ආචාර විධි
- යටත්විජිතකරණය

### සම්පත් හා ආධාරක පද්ධති වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම

#### පුද්ගල/ සම්බන්ධතා දායකත්ව සාධක

- සමාජ හුදකලාව සහ උපකාරක පද්ධති වෙත සීමිත ප්‍රවේශය
- ආදායම, අධ්‍යාපනය, රැකියා
- සාපේක්ෂ ශ්‍රම බලකා තත්වය
- මත්පැන් හා නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය*
- දුර්වල මව්පිය භූමිකා
- පෞරුෂත්ව ලක්ෂණ සහ දුර්වල මානසික සෞඛ්‍යය
- සම්බන්ධතා හා විවාහ ගැටුම්
- දික්කසාදය/ වෙන්වීම

#### ප්‍රජා සහ සංවිධානමය දායකත්ව සාධක

- දුර්වල සමාජ සම්බන්ධතා හා සමාජ සංහිඳියාව සහ කාන්තාවන් අතර සීමිත සාමූහික ක්‍රියාකාරකම්
- පවුලේ රහස්‍යභාවය සම්බන්ධයෙන් දැඩි සහාය
- අසල්වැසි ලක්ෂණ (සේවා යටිතලය, විරැකියාව, දිළිඳුකම, සාමූහික කාර්යක්ෂමතාව)

#### සමාජමය දායකත්ව සාධක

- පවුලේ රහස්‍යභාවය හා ස්වාධිපත්‍යය වෙත දක්වන සහාය
- ද්‍රව්‍යමය සම්පත් අසමාන ලෙස බෙදීයාම (උදා: රැකියා, අධ්‍යාපනය)

## ජනගහන කණ්ඩායම් සහ වැළැක්වීමේ ක්‍රියා

#### වැළැක්වීමේ ක්‍රියා

- සමීක්ෂණ, අධීක්ෂණය හා ඇගයීම
- ඍජු සහභාගීත්ව වැඩසටහන්
- සංවිධානමය හා ශ්‍රම බලකාය සංවර්ධනය
- ප්‍රජාව ශක්තිමත් කිරීම
- සන්නිවේදනය හා සමාජ අලෙවිකරණය
- උද්දේශනය
- නීතිමය හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ

#### ජනගහන කණ්ඩායම්

- ළමයින්
- තරුණ ජනයා
- කාන්තාවන් සහ පිරිමින්
- අවාසිදායක තත්වයන් නිසා පීඩාවට පත් අසල්වැසියන්
- ස්වදේශික කණ්ඩායම්
- ග්‍රාමීය ප්‍රජාවන්
- සංස්කෘතික හා වාග් විද්‍යාත්මක වශයෙන් විවිධ වන ප්‍රජාවන්
- ආබාධ සහිත කාන්තාවන්

## ක්‍රියාකාරීත්වය සඳහා පසුබිම හා අංශ

- ප්‍රජා සේවා
- සමාගම්
- ආගමික ප්‍රජාවන්
- අධ්‍යාපනය
- සේවාස්ථාන
- සංස්කෘතික ආයතන හා ජාලයන්
- කලා
- ක්‍රීඩා හා විනෝද
- මාධ්‍ය හා ජනප්‍රිය සංස්කෘතිය
- පළාත් පාලනය
- සෞඛ්‍යය
- සයිබර් අවකාශය/ නව තාක්ෂණයන්
- යුක්තිය
- අධ්‍යාපනික
- හමුදා/ ඒ හා සමාන ආයතන

## අතරමැදිකාලීන ප්‍රතිඵල

#### පුද්ගල/ සම්බන්ධතා

- සම්පත් හා සහාය සඳහා වැඩිදියුණු කරන ලද සම්බන්ධතා
- ගෞරවනීය හා සාධාරණ සමාජභාවී සම්බන්ධතා
- සමාජභාවී සමානාත්මතාව, සමාජභාවී භූමිකා සහ ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩිදියුණු වූ ආකල්ප
- අන්තර් පුද්ගල ගැටුම් විසඳීම සම්බන්ධයෙන් වැඩිදියුණු කරන ලද කුසලතා
- වගකීම් සහිත ලෙස මත්පැන් භාවිතා කිරීම

#### සංවිධානමය

පහත දැක්වෙන ආකාරයේ සංවිධාන

- සමාන ගරුත්වය හා අහිංසාවාදී සමාජභාවී සම්බන්ධතා ආදර්ශ නිර්මාණය කරන, ප්‍රවර්ධනය කරන හා ඒවාට පහසුකම් සපයන
- ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අංශ අතර හවුල්කාරීත්වයෙන් වැඩකරන
- සාක්ෂි මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරන
- කාන්තාවන්ට ළඟාවිය හැකි, ආරක්ෂාකාරී සහ උපකාරශීලී

#### ප්‍රජා

දැක්වෙන ආකාරයේ පරිසරයන්

- අහිංසාවාදී සහ ගෞරවනීය හා සාධාරණ සමාජභාවී සම්බන්ධතා සහිත සමාජ සම්මතයන් අගය කරන හා ඒවාට සහාය වන
- ජනයා හා තමන් අතර සම්බන්ධතා ගොඩනගන සහ විධිමත් හා අවිධිමත් සහාය ලබාදෙන
- ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පියවර ගැනීම

#### සමාජයීය

පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් ශක්තිමත් නීතිමය හා නියාමන ව්‍යූහයන් සහ යෝග්‍ය සම්පත් වෙන්කිරීම් සහිත සමාජයන්

- සමාජභාවී සමානාත්මතාව
- ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා තහනම් කිරීම
- කාන්තාවන් සාධනීය ලෙස නිරූපණය කිරීම: උදා: දැන්වීම් ආදියෙහි)
- කාන්තාවන් සහ පිරිමින් අතර සාධනීය සම්බන්ධතා ගොඩනැගීම

## දිගුකාලීන වාසි

#### පුද්ගල/ සම්බන්ධතා

- ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත මානසික සෞඛ්‍ය ගැටලු හා මරණ අවම කිරීම
- වර්ධනය වූ අන්තර් පුද්ගල, පවුල් හා සමාජභාවී සම්බන්ධතා
- ප්‍රචණ්ඩත්වය හා එහි බලපෑම් පරම්පරාවෙන් පරම්පරාවට මාරුවීම අවම වීම

#### සංවිධානමය

- ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සම්පත් හා ක්‍රියාකාරකම් අංශ හා පසුබිම් අතර ඒකාබද්ධ කිරීම
- ගෞරවනීය සමාජභාවී සම්බන්ධතා අගය කරන හා ප්‍රවර්ධනය කරන සංවිධාන
- සම්පත් හා සහායක පද්ධති වෙත වැඩිදියුණු කරන ලද ප්‍රවේශය

#### ප්‍රජා

- කාන්තාවන් සහ පිරිමින් අතර සමාජභාවී සමානාත්මතාව සහ ගෞරවනීය සම්බන්ධතා අගය කරන ප්‍රජාවන්
- සමාජ හුදකලාභාවය අවම කිරීම සහ ප්‍රජා සම්බන්ධතා වැඩිදියුණු කිරීම

#### සමාජයීය

- සමාජ අසමානාත්මතා අවම කිරීම
- පිරිමින් හා කාන්තාවන්ගේ ජීවිත ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
- ප්‍රචණ්ඩත්වය/ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම
- ඵලදායිතාව වැඩිකිරීම

# වැළැක්වීම සඳහා සම්පත්

### 1 පියවර: ගෝලීය ව්‍යුහයන් සහ සාක්ෂි

- UN Prevention Framework (2015) විසින් වෙනස් කිරීමේ න්‍යාය සිතියම්ගත කිරීමේ චළඹුමක් ඔස්සේ මනා ලෙස ඉලක්ක කරන ලද වැළැක්වීමේ එළඹුම් ක්‍රියාත්මක කිරීම සඳහාත් වැළැක්වීම සඳහා වැඩසටහන් සම්පාදනය ආරම්භ කිරීම සඳහාත් සම්පත් සපයයි.

- RESPECT Women: Preventing Violence against Women Framework (2019) පදනම් වන්නේ එක්සත් ජාතීන්ගේ වැළැක්වීමේ ව්‍යුහය මතය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට උපකාර පිණිස සාක්ෂි මත පදනම් වූ මූලෝපායක් සම්පාදනය කරයි.

- Global Framework on Women's Safety in Rural Spaces (2019) අවධානය යොමුකරන්නේ පොදු ස්ථානවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා හිංසනය වැළැක්වීම කෙරෙහිය. මෙම ව්‍යුහය විසින් තේ කර්මාන්ත අංශය සම්බන්ධයෙන් පොදු අවබෝධයක් ඇතිකිරීමට උපකාර කරනු ලැබේ. එය කෘෂිකර්මාන්ත වටිනාකම් දාමවල අනෙකුත් පාරිභෝගික භාණ්ඩ අංශවලට ද යොදාගත හැකිය.

- What Works to Prevent VAWG Evidence Hub විසින් එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුවේ (DFID) සන්නාම ගෝලීය සමීක්ෂණ සහ රටවල් 13ක නවෝත්පාදන වැඩසටහන්වල සොයාගැනීම් ඉදිරිපත් කරනු ලැබේ. DFID කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ උපකාරක කාර්යාංශය විසින් කාර්තුවකට වරක් පළකරන VAWG Evidence Digests විසින් අලුත්ම සමීක්ෂණ, ප්‍රතිපත්ති සහ ප්‍රවෘත්ති සාරාංශයක් ඉදිරිපත් කරනු ලැබේ.

- UN Trust Fund (UNTF) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා සාක්ෂි සහ අධ්‍යයන මධ්‍යස්ථානක් විසින් රටවල් හා භූගෝලීය කලාප 80ක කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මුලපිරුම්වල වාර්තා පුස්තකාලයක් සපයයි.

- Prevention Collaborative's Knowledge Platform විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ මනාව සංවිධානය කරන ලද, පහසුවෙන් ලබාගත හැකි වැදගත් සාක්ෂි සහ භාවිතාවන් සමුදායක් සපයයි. වැඩසටහන් එළඹුම් ද එයට අයත් වේ.

### 2 පියවර: ජාතික සංදර්භය හා සාක්ෂි තක්සේරු කරන්න

- International Men and Gender Equality Studies (IMAGES) සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පිරිමින්ගේ (සහ කාන්තාවන්ගේ) ආකල්ප සම්බන්ධයෙන් ජනගහන පාදක දත්ත සපයයි.

- UN Multi-country Study on Men and Violence රටවල් හතක ක්‍රියාත්මක කරන ලදී. එහිදී පිරිමින් විසින් කාන්තාවන්ට එරෙහිව සිදුකරන ප්‍රචණ්ඩත්වය අවබෝධ කරගැනීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද භාවිතා කරන ලදී. එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෙවලම් කට්ටලයක් ද එයට ඇතුළත්ය.

- WHO multi-country study on women's health and domestic violence against women හි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ ආකල්ප සහ වෙනත් අවදානම් සාධක පිළිබඳධ ප්‍රශ්න අඩංගු වේ.

- Demographic and Health Surveys (DHS) විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ජනගහනය පාදක කරගත් දත්ත සම්පාදනය කරනු ලැබේ. ආකල්ප හා විශ්වාසයන් ද එයට ඇතුළත් වේ.

- Fundamental Rights Agency Survey on Violence against Women මගින් යුරෝපා සංගමයේ රටවල් 28ක් ආවරණය කරනු ලැබේ.

- International Men and Gender Equality Study in the Middle East and North Africa මගින් පුරුෂමූලිකත්වය අවබෝධ කරදෙනු ලැබේ.

- OSCE Survey on the Well-being and Safety of Women රටවල් හතක ක්‍රියාත්මකකරන ලදී. එහි අරමුණ වන්නේ ගිනිකොණදිග යුරෝපයේ සහ නැගෙනහිර යුරෝපයේ රටවල ප්‍රචණ්ඩත්වයේ පැවැත්ම හා එය ධාවනය කරන බලයන් අවබෝධ කරගැනීමයි.

- Oak Foundation iy Economist's Out of the Shadows යනු රටවල් 60ක සැසඳුම් නියාමනයන් සිදුකරන දර්ශකයකි. එමගින් ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, භාවිතාවන් සහ ප්‍රමිති අධ්‍යයනය කරනු ලැබේ.

# අමතර මූලාශ්‍ර

- Sexual Violence Research Initiative (SVRI) යනු, පහළ සහ මැද ආදායම් සහිත රටවල ලිංගික හිංසනය සම්බන්ධ ගුණාත්මක සමීක්ෂණ සඳහා වන ගෝලීය ජාලයකි.
- Community for Understanding Scale Up (CUSP) යනු, විවිධ සංදර්භයන් තුළ වැළැක්වීමේ මැදිහත්වීම් සංවර්ධනය සඳහා දැනුම සහ පාඩම් බෙදාහදාගන්නා සංවිධාන නවයක කණ්ඩායමකි.
- එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ Virtual Knowledge Centre to End VAW විසින් මුලපිරුම්, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ පියවරෙන් පියවර මාර්ගෝපදේශ සපයනු ලැබේ. විශේෂිත අංශ, කණ්ඩායම් හෝ මැදිහත්වීමේ කලාප සමග වැඩකිරීමේ මාර්ගෝපදේශය ද එයට අයත් වේ.
- Equality Institute (EQI) යනු සමාජභාවී සමානාත්මතාව උසස් කිරීමට සහ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වෙනුවෙන් වැඩකරන ගෝලීය සමීක්ෂණ හා නිර්මාණාත්මක නියෝජිතායතනයකි.
- Partners for Prevention යනු කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කළ එක්සත් ජාතීන්ගේ අන්තර් නියෝජිතායතන මුලපිරුමකි. ආසියා පැසිෆික් කලාපයේ ක්‍රියාත්මක වන එය ප්‍රචණ්ඩත්වය පවත්වාගෙන යන සාධක සහ වැඩසටහන්කරණයෙන් උගත් පාඩම්වල සාරාංශ සම්බන්ධ ගැඹුරු සමීක්ෂණ සිදුකරයි.

# පසු සටහන

[1] CEDAW, SDGs, Beijing Platform for Action, Maputo Protocol (අප්‍රිකාව), Belém do Pará (ඇමරිකා) සහ Istanbul Convention (යුරෝපය) ආදිය

[2] බලන්න DFID's (2016) Guidance Note on Shifting Social Norms to Tackle VAWG.

[3] දැඩි ඇගයීම් නොමැති ඒවා සඳහා විශ්වාසනීය භාවිතාවන්ට පහත දැක්වෙන ඒවා අයත් වේ: භාවිතාව මත පදනම් වූ දැනුම සහ/හෝ නියෝජනාත්මක ප්‍රතිඵල ඔස්සේ (උදා: සමාජ සම්මතයන් වෙනස් කිරීම) ප්‍රතිඵල ප්‍රදර්ශනය කිරීම

[4] සාක්ෂි පදනම ලෙස සැලකෙන්නේ, දැඩි ඇගයීම් ක්‍රම භාවිතා කිරීම ඔස්සේ ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක් ප්‍රදර්ශනය කර තිබෙන වැඩසටහන් මැදිහත්වීම්ය.

[5] "Framework to Guide Primary Prevention of Violence Against Women" උපුටාගනු ලැබුවේ 'Preventing violence before it occurs. A framework and background paper to guide the primary prevention of violence against women in Victoria' වෙතිනි. එය පළකරනු ලැබුවේ Victorian Health Promotion Foundation විසිනි.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020), RESPECT: Preventing Violence against Women National Plan Guide & Workbook.